# ලොවෙහි මෙතෙක් බිහි වූ අසීමිත හැකියා ගොනුව

මවනවා සහ වැවෙනවා යන වදන් දෙකෙහි ඇත්තේ අති මහත් මෙන් මැ එකිනෙකට වෙනස් අදහස් දෙකකි. මැවීමට නම් මවන කෙනෙකු සිටියැ යුතු යැ. ඔහුගේ මැවීම් සියල්ල ඔහුගේ තීරණය මත සිදු වෙයි. මැවෙනවා කී විටැ මැවීම කරන කෙනෙකු ඇත්තේ නැත. නො පවතින දෙයක් කෙනෙකු ගේ මැදිත් වීමක් නැතිවැ ඇති වන විටැ අප එය හඳුන්වන්නේ මැවෙනවා යනුවෙනි. එය හඳුන්වන තවත් වචනයක් වනුයේ 'ස්වයංක්‍රිය' යනු යැ.

මා විසින් මවනවා සහ මැවෙනවා යන දෙ වදන පෙරට ගත්තේ, මිනිසා මවන ලද ද, නො එසේ වැ මැවෙන ලද ද යනු නිගමනය කිරීම සඳහා යැ. කිසියම් දෙයක් මවන ලද නම්, එහි හැඩ රුව සහ ක්‍රියා පිළිවෙත ද මවන ලද අයුරු මැ පැවැතිය යුතු යැ. එසේ නැතිවැ එයට වැඩි මනත් ක්‍රියා කලාපයක් ඇවැසි වුවහොත්, එසේ ඇවැසියාව දැනෙන සෑම වාරයක් පාසා මැ තව තවත් එකතු කිරීම් කළ යුතු වෙයි. එසේ නො වුණ හොත් එය මුල දී මවන ලද අයුරින් මැ පවතිනු ඇත. මෙයින් බැහැර වැ ස්වයංක්‍රිය වැ මැවුණු දෙයක් වෙතොත් එහි වෙනස වනුයේ. තව තවත් එකතු කිරීමේ ඇවැසි වුව හොත් ඒවා ද මුලින් සිදු වූ අයුරු මැ ස්වයංක්‍රිය වැ සිදු වීමයි.

අප විසින් දැන් මිනිසා පෙරට ගෙනැ, ඔහු මුල දී කවුරුන් හෝ විසින් මවන ලද අයරු මැ පවතින්නේ ද, නැතිනම් වරින් වරැ අඩු-වැඩි වීම් සිදුවෙමින් පැවැතී යන්නේ ද යනුවෙන් වැ හඳුනා ගත යුතුය. මේ සඳහා අප ආදී කාලීන මිනිසා ගැන සිතා බැලියැ යුතු වෙයි. ඔහු ගේ ජීවිත රටාව, ගැවැසුණු-හැසිරුණු ආකාරය, ආහාර පාන ආදිය අනුවැ සිතා බලන විටැ, මෙයට සියවස් ගණනකට පෙරරැ විසූ මිනිසා අද සිටින මිනිසා තරම් දියුණු තත්වයෙකැ නොසිටි බවක් පෙනෙයි.

එවන් මිනිසා කිසිවකු විසින් මවන ලද නම්, ඔහු මුලදී මවන ලද පරිදි අද දක්වා මැ පැවැතිය යුතුයැ. එසේ නැතිවැ කල් යත් මැ මිනිසාට අමතර දැනුම සහ ක්‍රියාකාරකම් ලැබුණේ නම්, තමා විසින් මවන ලද මිනිසා ගේ වැඩි දියුණුව ගැන සොයා බලමින් ඔහු පසු පසැ මැ සිටිමට මැවුම්කරුට සිදු විය හැකි යැ.

අනික් අතට බලන විටැ, මිනිසා ඉබේ මැවුණු ප්‍රාණියෙකු නම්, අද දක්වා මිනිසා විසින් ප්‍රදර්ශනය කරන බාහිර පෙනුම, පියවරෙන් පියවරට දියුණු වී යන දැනුම සහ අවබෝධය ද කවුරුන්ගෙන් හෝ ලැබුණා නොව මිනිසා තමා විසින් ම උපයා-සපයා ගත් දියුණුව බව අපට පිළිගැනීමට සිදුවේ. මේ පිළිබඳ වැ නිගමනයකට බැසීම සඳහා අපි එදා සිටැ අද දක්වා වූ මිනිස් ක්‍රියාකාර කම් ගැන විමසා බලමු.

ආදි කාලීන මිනිසා ඇඳුම්-පැළැඳුම්, ගේ-දොර, යාන-වාහන ආදී වූ කිසිවක් පරිහරණය කළේ නැත. එහෙත් කල් කයත් මැ ඒ සියලු දේ එකින් එක තම පරිහරණය සඳහා සොයා ගති. ඒකරාශී වීම, පොදු පහසුකම් සපයා ගැනීම, සිරිත් විරිත් හා ඇදහීම් ද මිනිසා සිතා බලා වැඩි දියුණු කරැ ගත් දේවල් යැ. මේ අයුරින් පෙරට පැමිණි මිනිසා අද වන විටැ පොළෝ තලයෙන් ඔබ්බට ද සිය හැකියාවන් යොමු කරැ කලක් ගතවී තිබේ. සඳ මතැ සැරි සරා පැමිණි මිනිසා දැන් සිය අවධානය යොමු කරමින් සිටිනුයේ අනෙකුත් ග්‍රහ ලෝක තරණයටයැ.

මෙ වැනි විශ්මය ජනක ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම මිනිසාට බාහිර බලවේග යකින් ලැබුණු බවක් නම් සනාත කළ නොහැකිය. ඔහු තමා විසින් මැ සොයා ගත් දැනුම-අවබෝධය තුළින් තව-තවත් ඉදිරියට යනු පමණක් ඉතා පැහැදිලි යැ.

මිනිසාගේ නව නිපැයුම් ගැන සිතා බලන විට එකිනෙකට වෙනස් වූ අන්ත දෙකක් අපි දකිමු. එක අන්තයක් වනුයේ බොහෝ දේ නිපදවන මිනිසාට වසර 120ක් ඉක්මවා ජීවත් වී සිටීමට මඟක් තවමැ පාදා ගෙනැ නැත. අනික් අන්තය නම් කිසියම් රටකැ සිටින මිනිස් ප්‍රජාව එක මොහොතකැ දී මරණයට පත් කිරීමට හැකියාව මිනිසා සතු කර ගෙනැ තිබීමයි.

මිය යන මිනිසා යළිත් වරක් මිනිසුන් අතරැ මැ ඉපදී, සසර නම් වූ ගමනෙකැ යොදන බව ලෝ වැසි ජනයාගෙන් හරි අඩකට ආසන්න පිරිසක් දැනට පිළිගෙනැ තිබේ. එම සසරැ පැවැත්මෙන් පවා ඉවත් වී යන මඟ එක්තරා උතුම් මිනිසෙකු විසින් පෙන්වා දෙන ලදුවැ, ඒ අනුවැ පැවැත්මෙන් ඉවත්වී ගිය පිරිසද අති මහත්යැ. ඒ අනුවැ සලකා බලන විටැ, සිදුහත්-ගෝතම බුදු හිමියන් විසින් සොයා දෙන ලද පැවැත්ම නැවැත්වීමේ නිවන් මඟ මිනිසෙකු විසින් සොයා ගත් උත්තරීතර දැනුම් සම්භාරය බව අප පිළිගතය යුතු යැ.



සිරිවිමල මුතුකුමාරණ
ඩැන්ඩිනොං


For all your
Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833


## පාලි පාඨ හෙළ බසින්-35

"කුම්භූපමං කාය'මිමං විදිත්වා
නගරූපමං චිත්ත'මිදං ඨපෙත්වා
යෝධේථ මාරං පඤ්ඤාවුධෙන
ජිතංච රක්ඛේ අනිවේසනොසියා"
(ධම්මපද 40-චිත්ත වග්ග)

කය මැටි බඳුනක් සේ දැන
නුවරක් සේ සිත රැකැගෙන
නුවණින් මරුැ ද පරදා
සසර'ම්බලම බිඳ ලනු

සිරිවිමල මුතුකුමාරණ - ඩැන්ඩිනොං

## "පහන" කලකට ආයුබෝවන්!

අසූ පස් වසරකට පෙරැදී ඇරැඹු ගමනක් තව මැ යනවා
බොහෝ දේවල් මතක පිටුවෙන් මැකී යනුයෙන් ඉවත් වෙනවා
එදා මතකයෙ තිබුණ සිතුවම් පැහැය බොඳ වී මැකී යනවා
සසර ගමනේ නවාතැන හැරැ ළහැදි නැවතත් පිටත් වෙනවා

මෑණියන් ළඟැ හැදුණු කාලය විටින් විටැ මතකයට එනවා
බීපු කිරිවල ජවය තවමත් පෙරමුණට මා රැගෙන යනවා
කෙළිදෙලෙන් ගෙවු ළමා කාලය කඩින් කඩැ මතකයට එනවා
නියත අනියත දෙකෙහි සලකුණු බුලු බැලූ අතැ ලකුණු වෙනවා

පාසලින් ලද මහඟු විදුඇස තව මැ මාහට පිහිට වෙනවා
පිරිවෙනින් ලද බසෙහි සවියෙන් රසැති පදවැල් ගෙතී එනවා
පුවත් පතකට යමක් ලියමින් බෙදා දෙන්නට දිරි වඩනවා
නොබෝ දිනකින් ගමන නිම වෙන ලකුණු දැන් මතු වෙවී එනවා

ළඟැදි නැවතත් මව් බිමට ගොස් දැකැ බලන්නට සිතක් මතුවෙයි
ඉතිරි වී ඇති නෑසියන් හමුවෙලා එන ලෙස රිසිය දනවයි
"පහන" කරවන මිහිරි මිතිණියෙ ඉතින් කලකට ලියනු බැරිවෙයි
"පහන" පාඨක සමාජයට ද මගේ හරසර මෙයින් හිමි වෙයි

සිරිවිමල මුතුකුමාරණ - ඩැන්ඩිනොං

ශ්‍රී ලංකාවේ විජේරාම ගංගොඩවිල ප්‍රදේශයේ පදිංචි දසුන් දන්තනාරායන 30 හැවිරිදි තරුන පුතෙක් වකුගඩු රෝග යෙන් පෙළෙන අතර වකුගඩු බද්ධය සදහාරුපියල් ලක්ෂ 15ක මුදලක් අවශ්‍ය කෙරේ. මේ සඳහා දායක වීමට කැමැති පිංවතුන්ගේ කාරුණික ආධාරය බලාපොරොත්තු වෙමු.

AC NO: 097200307343462
මහජන බැංකුව ගංගොඩවිල ශාඛාව

ගිණුමේ නම : M. A ඩේසි
දුරකතන අංකය : 001194112802161

Melbourne Contact:
Priyantha Gamage - 0433 564 384